# 9.අන්තර් ජාතික වෙළඳාම

අන්තර්ජාතික වෙළඳාම යනු රටක් තම දේශසීමාවෙන් පිටත පිහිටි රටවල් අතර සහ ජාත්‍යන්තර සංවිධාන අතර සිදු කරන වෙළඳාමයි.මෙහි ස්වරූප දෙකකි.

1. **අපනයන වෙළඳාම** - රටක් තවත් රටකට භාණ්ඩ හා සේවා අලෙවි කිරීම.
2. **ආනයන වෙළඳාම** - රටක් තවත් රටකින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම.

❖ අන්තර්ජාතික වෙළඳාම ට පදනම සපයන මූලධර්ම

1) නිරපේක්ෂ වාසි සිද්ධාන්තය
2) සාපේක්ෂ වාසි සිද්ධාන්තය

## 1. නිරපේක්ෂ වාසි සිද්ධාන්තය

- ජාත්‍යන්තර වෙළඳාම ට හවුල් වන රටවල් දෙකින් එකකට වැඩිම ඵලදායිතාවකින් හෝ අඩුම පිරිවැයකින් නිපදවා අපනයනය කිරීමෙන් දෙරටටම වාසි ලබාගත හැකි වීම වේ.
- වැඩිම ඵලදාව කින් හෝ අඩුම පිරිවැයකින් නිපදවිය හැකි භාණ්ඩ කෙරෙහි විශේෂිකරණය වේ.
- අතිරික්තය සිය වෙළෙඳ සහකරු සමග හුවමාරු කර දෙරටටම වාසි ලබා ගනී.
- හඳුනාගත හැකි ආකාර දෙකකි .

❖ **නිෂ්පාදන හැකියාව (ඵලදායිතාව) → නිමවුම** ↑

| | කාර් | වෑන් |
|---|---|---|
| ජපානය | 500 | 800 |
| ජර්මනිය | 1200 | 400 |

- වෑන් පිළිබඳ වැඩි ඵලදායිතාවය - **ජපානය**
- කාර් පිළිබඳ වැඩි ඵලදායිතාවය - **ජර්මනිය**
- එම නිසා නිරපේක්ෂ වාසිය,

  වෑන් - ජපානය

  කාර් - ජර්මනිය

❖ **නිෂ්පාදන පිරිවැය (ශ්‍රම කාලය) පිරිවැය ↓**

| | සහල් ශ්‍රම පැය (ඒකකයකට) | තිරිඟු ශ්‍රම පැය (ඒකකයකට) |
|---|---|---|
| පකිස්තානය | 3 | 8 |
| තුර්කිය | 10 | 5 |

- අඩු පිරිවැයකින් සහල් නිපදවීම- **පකිස්තානය**
- අඩු පිරිවැයකින් තිරිඟු නිපදවීම - **තුර්කිය**
- එම නිසා නිරපේක්ෂ වාසිය,

  සහල් - පකිස්තානය

  තිරිඟු- තුර්කිය

ස්වයං නිෂ්පාදනය නොකර විශේෂිකරණය වී අතිරික්ත හුවමාරු කර ගැනීමෙන් කරගැනීමෙන් ලොව ට ලැබෙන සමස්ත නිෂ්පාදනය වැඩිකර ගත හැකිය.

## 2. සාපේක්ෂවාදී මුලධර්ම

ශ්‍රී ලංකාව හා චීනය තේ හා රෙදි පිලි නිෂ්පාදනය කරන බවත් සංයුක්ත සම්පත් ඒකකයකින් ලබාගත හැකි නිමැවුම පහත දැක්වේ.

| | තේ | රෙදි පිලි |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 5 | 4 |
| චීනය | 6 | 5 |

- භාණ්ඩ 2 ම නිෂ්පාදනය සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසි පවතින්නේ චිනයටයි. ඒ නිසා නිරපේක්ෂ වාසි මුලධර්ම යටතේ වෙළදාමක් සිදු විය නොහැක. එවැනි තත්වයකදී රටවල් 2ක් අතර වෙළදාමක් සිදුවේදැයි සොයා බැලීමට සාපේක්ෂ වාසි බැලිය යුතුය.
- සාපේක්ෂවාසි මුලධර්මය පදනම් වන්නේ අඩු සාපේක්ෂ පිරිවැය හෙවත් අඩු ආවස්ථික පිරිවැය යි.

| | තේ නිෂ්පාදනයේ ආවස්තික පිරිවැය අනුපාතය | රෙදිපිළි නිෂ්පාදනයේ ආවස්තික පිරිවැය අනුපාතය |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 4/5 = 0.80 | 5/4 = 1.25 |
| චීනය | 5/6 = 0.83 | 6/5 = 1.20 |

- තේ නිෂ්පාදනය සම්බන්දයෙන් අඩුම ආ.පි ඇත්තේ ශ්‍රී ලංකාවටයි. ඒ නිසා ශ්‍රී ලංකාව තේ විශේෂ ප්‍රාගුන්‍ය කොට අතිරික්තයක් නිපදවා එය චීනයට අපනයනය කල යුතුය.
- රෙදිපිළි නිෂ්පාදනය සම්බන්දයෙන් අඩුම ආ.පි ඇත්තේ චිනයටයි. ඒ නිසා චීනය රෙදිපිළි විශේෂ ප්‍රාගුන්‍ය කොට අතිරික්තයක් නිපදවා එය ශ්‍රී ලංකාවට අපනයනය කල යුතුය.

# ආරක්ෂණය (Protection)

## (ආරක්ෂනවාදය/ වෙළඳ බාධක)


- දේශීය නිෂ්පාදකයින්ට විදේශ වෙළඳාමෙන් ඇති විය හැකි හානිය වළක්වාලීමට ගනු ලබන ක්‍රියාමාර්ග ආරක්ෂණය ලෙස හඳුන්වයි.
- ආරක්ෂණය දිගින් දිගටම යෝග්‍ය නොවන අතර කර්මාන්තය ශක්තිමත් මට්ටමකට පැමිණි විට ආරක්ෂණය ඉවත් කර තරගයට විවෘත කල යුතුය.
- ආරක්ෂණ ක්‍රියාමාර්ග 02කි.

1. තීරු බදු සම්බාධක
2. තීරු බදු නොවන සම්බාධක

### ❖ තීරු බදු සම්බාධක (Traffic Barriers)

එනම් ආනයනය කරනු ලබන භාණ්ඩ මත බදු අය කිරීමයි.ප්‍රධාන ආකාර 3 කි.

- භාණ්ඩයේ වටිනාකමෙන් ස්ථිර ප්‍රතිශතයක් අය කිරීම
- ආනයන ඒකකයක් මත නිශ්චිත මුදලක් අය කිරීම
- මිශ්‍රිත තීරු බදු අය කිරීම



### ❖ තීරු බදු නොවන සම්බාධක (Traffic Barriers)

- සලාක ක්‍රමය
- කාටල පිහිටීම
- විනිමය පාලනය
- කලාපීය ආර්ථික සහයෝගිතාවය
- ආනයන අපනයන බලපත්‍ර
- ප්‍රපතනය
- සහනාධාර
- වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම

### ආරක්ෂණයට පක්ෂව තර්ක

- දේශීය ළදරු කර්මාන්ත (එනම්, ආරම්භක අවදියේ පසුවන කෙටිකාලින කර්මාන්ත )විදේශ තරගයෙන් ආරක්ෂා වීම.
- ප්‍රපතනය වැලැක්වීම (විරුද්ධ නීති පැනවීම).
- දේශීය සම්පත් උපයෝජනය ඉහල යාම.
- අසාධාරණ තරගය වැලැක්වීම (ළමා ශ්‍රම භාවිතය, අඩු වැටුප්).
- දේශීය වශයෙන් ස්වයංපෝෂිතභාවය පුළුල් කිරීම.
- අවගුණ භාණ්ඩ ආනයනය අඩාල වීම (මත්ද්‍රව්‍ය, මත්පැන්, දුම්වැටි).
- මව් රටේ රැකී රක්ෂා ආරක්ෂා කර ගැනීම සහ පුළුල් කිරීම.
- රාජ්‍ය අයභාරය ඉහල යාම.
- සේවා ව්‍යුක්තිය වැලැක්වීම

### ආරක්ෂණයට විපක්ෂව තර්ක

- දේශීය හා විදේශීය වශයෙන් වෙළඳපොල සංකෝචනය වීම.
- උද්ධමනකාරී තත්ත්වයන් ඇතිවිය හැකි වීම.
- වෙළදාම සංකෝචනය වන විට ජාතික අදායම පහල වැටීම.
- පාරිභෝගිකයාට භාණ්ඩ වෙනුවෙන් ඉහල මිලක් ගෙවීමට සිදු වීම (පාරිභෝගිකයා මත බදු පැනවීමක් හා සමාන වීම).
- විවිධ දූෂණයන් ඇති වීම (රේගු වංචා).
- විදේශ තාක්ෂණය, ප්‍රාග්ධනය හා විදේශ ආයෝජන සංක්‍රමණයට බාධා වීම.
- නිදහස් ජාත්‍යන්තර වෙළදාමේ වැසි ලබා ගත නොහැකි වීම.
- අකාර්යක්ෂම කර්මාන්ත පවත්වාගෙන යාමට සානුබල සැපයීම.

### <u>නාමික ආරක්ෂණ අනුපාතය (Nominal Rate of Protection)</u>

ආනයනික භාණ්ඩ මත  තීරු බදු වැඩි කිරීමේ ප්‍රතිපලයක් ලෙස විදේශීය නිෂ්පාදිත භාණ්ඩ වල මිල ඉහල යාම තුලින් දේශීය භාණ්ඩ සදහා ඇති වන ආරක්ෂණය නාමික ආරක්ෂණය නම් වේ.

මෙමගින් නිෂ්පාදනයේ සැබෑ ආරක්ෂණය පිළිබිඹු නොවේ.

### <u>සඵල ආරක්ෂණ අනුපාතය (Effective Rate of Protection)</u>

තීරු බදු අය කිරීමට පෙර දේශීය නිමවුමේ එකතු කල අගයට සාපේක්ෂව තීරු බදු අය කල පසු දේශීය නිමවුමේ එකතු කල අගය කොපමණ ප්‍රතිශතයකින් වැඩි වී ඇත්ද යන්න සඵල ආරක්ෂණ අනුපාතයෙන් අදහස් වේ.

### විකල්ප මිනුම

$$ERP = \frac{n - ab}{1 - a}$$

n = අවසාන භාණ්ඩය මත තීරු බදු

a = දේශීය නිමවුමේ ආනයන යෙදවුම් ප්‍රතිශතය

b = යෙදවුම් මත තීරු බදු

## ❖ විදේශ වෙළඳාමට සම්බන්ධ අනුපාත

විදේශ වෙළඳාමට වැදගත් වන අනුපාත දෙකක් දැකිය හැකිය.

1) වෙළඳ අනුපාතය
2) ආදායම් වෙළඳ අනුපාතය

### 1) වෙළඳ අනුපාතය

වෙළඳ අනුපාතය යනු කිසියම් කාලපරිච්ඡේදයක් තුල අපනයන ඒකකයකින් කල හැකි ආනයන ප්‍රමාණයයි. එනම් අපනයන ඒකකයක ආනයන ක්‍රය ශක්තියයි.

මෙය විදේශ වෙළඳ අනුපාතය, භාණ්ඩ වෙළඳ අනුපාතය යන විකල්ප නම් වලින්ද හඳුන්වයි.

**උදාහරණය :**

කිසියම් රටක පදනම් වර්ෂයට සාපේක්ෂව අපනයන මිල දර්ශකය 40% කින්ද, ආනයන මිල දර්ශකය 20% කින්ද, ඉහළ ගියේ නම් එම රටෙහි වෙළඳ අනුපාතය කෙසේ වෙනස් වේද?

වෙළඳ අනුපාතය 16% කින් වැඩි වේ.

$$\text{වෙළඳ අනුපාතය} = \frac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$$

$$\text{වෙළඳ අනුපාතය} = \frac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$$

$$= \frac{140}{120} \times 100 = 116$$

### වෙළඳ අනුපාතය පිරිහීම

- වෙළඳ අනුපාතය පිරිහීම යනු අපනයන ඒකකයක ආනයන ක්‍රය ශක්තිය පහළ යාමයි.
- පෙර වර්ෂට සාපේක්ෂව වෙළඳ අනුපාතයේ අගය අඩු වීම මගින් වෙළඳ අනුපාතයේ පිරිහීම පෙන්වයි.

#### වෙළඳ අනුපාතය පිරිහීම සිදු වන අවස්ථා

- → ආනයන මිල ස්ථාවරව තිබියදී අපනයන මිල පහළ යාම.
- → අපනයන මිල ස්ථාවර තිබියදී ආනයන මිල ඉහළ යාම.
- → අපනයන මිල පහළ යාමත් ආනයන මිල ඉහළ යාමත් එකවර සිදු වීම.
- → අපනයන මිල වැඩිවන වේගයට වඩා වැඩි වේගයකින් ආනයන මිල ඉහළ යාම.
- → ආනයන මිල පහළයන වේගයට වඩා වැඩි වේගයකින් අපනයන මිල පහළ යාම.

#### වෙළඳ අනුපාතය වාසිදායක වන අවස්ථා

- → ආනයන මිල ස්ථාවර තිබියදී අපනයන මිල ඉහළ යාම.
- → අපනයන මිල ස්ථාවර තිබියදී ආනයන මිල පහළ යාම.
- → ආනයන මිල පහළ යාම හා අපනයන මිල ඉහළ යාම එකවර සිදු වීම.
- → අපනයන මිල පහළ යන වේගයට වඩා වැඩි වේගයකින් ආනයන මිල පහළ යාම.
- → ආනයන මිල ඉහළ යන වේගයට වඩා වැඩි වේගයකින් අපනයන මිල ඉහළ යාම .

## ❖ වෙළඳ ශේෂය

වෙළඳ ශේෂය යනු ගෙවුම් ශේෂ ලේඛනයක භාණ්ඩ ගිණුමේ ශේෂය (භාණ්ඩ අපනයන ඉපයුම් සහ භාණ්ඩ ආනයන වියදම් අතර වෙනස) වේ.

ආනයන, අපනයන පරිමාවේ වෙනසක් සිදු නොවේ යැයි උපකල්පනය කල විට වෙළඳ අනුපාතය පිරිහීම වෙළඳ ශේෂය කෙරෙහි අහිතකර වේ.

### 2) ආදායම් වෙළඳ අනුපාතය (ආනයන ශක්‍යතාව)

අපනයන ඉපයුම් වල ආනයන ක්‍රය ශක්තිය වේ. එනම් අපනයන වටිනාකමින් මිලට ගත හැකි ආනයන ඒකක ප්‍රමාණයයි.

ආදායම් වෙළඳ අනුපාතයට අපනයන මිල මෙන්ම අපනයන ප්‍රමාණයද සැලකිල්ලට ගන්නා බව පෙනේ. එබැවින් එය පහත පරිදිද සෙවිය හැකිය.

$$\text{ආදායම් වෙළඳ අනුපාතය} = \frac{\text{අපනයන වටිනාකම් දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$$

$$\text{ආදායම් වෙළඳ අනුපාතය} = \frac{\text{අපනයන මිල දර්ශකය} \times \text{අපනයන පරිමා දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$$

## ශ්‍රී ලංකාවේ ආනයන අපනයන සංයුතිය

### ❖ ශ්‍රී ලංකාවේ ආනයන සංයුතිය.

ශ්‍රී ලංකාවේ ආනයන භාණ්ඩ ව්‍යුහය ප්‍රධාන කොටස් හතරකි.

I. පාරිභෝගික භාණ්ඩ
II. අන්තර් භාණ්ඩ
III. ආයෝජන භාණ්ඩ
IV. වර්ග නොකළ භාණ්ඩ

| | 2018 | | 2019 | |
|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය |
| **පාරිභෝගික භාණ්ඩ** | **4,979.70** | **22.4** | **3,956.50** | **19.8** |
| ආහාර හා පාන වර්ග | 1,606.10 | 7.2 | 1,426.90 | 7.2 |
| සහල් | 106.8 | 0.5 | 12.8 | 0.1 |
| සීනි හා රසකැවිලි | 249.7 | 1.1 | 201.2 | 1 |
| කිරි නිෂ්පාදිතය | 332.3 | 1.5 | 311.9 | 1.6 |
| පරිප්පු | 78.6 | 0.4 | 79.9 | 0.4 |
| වෙනත් | 838.7 | 3.8 | 821.2 | 4.1 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 3,373.60 | 15.2 | 2,529.60 | 12.7 |
| පෞද්ගලික රථවාහන | 1,573.50 | 7.1 | 815.7 | 4.1 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 532 | 2.4 | 552.6 | 2.8 |
| ගෘහ උපකරණ | 232.2 | 1 | 206.6 | 1 |
| රෙදිපිළි හා උපාංග | 310.3 | 1.4 | 275.1 | 1.4 |
| වෙනත් | 725.6 | 3.3 | 679.1 | 3.4 |
| **අන්තර් භාණ්ඩ** | **12,488.00** | **56.2** | **11369.6** | **57** |
| ඉන්ධන | 4151.9 | 18.7 | 3891.6 | 19.5 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2858.5 | 12.9 | 2909.4 | 14.6 |
| දියමන්ති ,අගනා ගල් හා ලෝහ වර්ග | 572.7 | 2.6 | 201.4 | 1 |
| රසායනික නිෂ්පාදිත | 904.2 | 4.1 | 831.5 | 4.2 |
| තිරිඟු හා ඉරිඟු | 373.5 | 1.7 | 346.6 | 1.7 |
| පොහොර | 261.6 | 1.2 | 221.4 | 1.1 |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | 3365.6 | 15.1 | 2967.9 | 14.9 |
| **ආයෝජන භාණ්ඩ** | **4690.4** | **21.1** | **4602.6** | **23.1** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1524.5 | 6.9 | 1508.7 | 7.6 |
| ප්‍රවාහන උපකරණ | 668.1 | 3 | 596.6 | 3 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 2491.6 | 11.2 | 2489.7 | 12.5 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 6.1 | 0.03 | 7.6 | 0.04 |
| **වර්ග නොකළ ආනයන** | **74.6** | **0.3** | **8.3** | **0.04** |
| **මුළු ආනයන** | **22,232.70** | **100** | **19931.1** | **100** |

| කාණ්ඩය | 2018 | | 2019 | |
|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % |
| **කෘෂිකාර්මික අපනයන** | **2,579.30** | **21.7** | **2,461.90** | **20.6** |
| තේ | 1,428.50 | 12 | 1,346.40 | 11.3 |
| රබර් | 31.6 | 0.3 | 24.2 | 0.2 |
| පොල් | 311 | 2.6 | 329.5 | 2.8 |
| කුළුබඩු | 360.2 | 3 | 312.5 | 2.6 |
| එළවළු | 28.2 | 0.2 | 32 | 0.3 |
| සකස් නොකළ දුම්කොළ | 35.6 | 0.3 | 34.7 | 0.3 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 118.4 | 1 | 120 | 1 |
| මුහුදු ආහාර | 265.8 | 2.2 | 262.5 | 2.2 |
| **කාර්මික අපනයන** | **9,258.20** | **77.9** | **9,426.30** | **78.9** |
| රෙදිපිළි හා ඇඟලුම් | 5,317.70 | 44.7 | 5,596.50 | 46.9 |
| රබර් නිෂ්පාදිත | 875.3 | 7.4 | 866.1 | 7.3 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 622.1 | 5.2 | 521.1 | 4.4 |
| මැණික් , දියමන්ති හා ස්වර්ණාභරණ | 278 | 2.3 | 305.7 | 2.6 |
| ආහාර , පාන වර්ග හා දුම්කොළ | 462.3 | 3.9 | 447 | 3.7 |
| යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 434.8 | 3.7 | 400 | 3.3 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිශ්පාදිත | 31.7 | 0.3 | 48.3 | 0.4 |
| ප්‍රවාහන උපකරණ | 120.3 | 1 | 145.9 | 1.2 |
| සම් භාණ්ඩ , සංචාරක භාණ්ඩ හා පාවහන් | 147.7 | 1.2 | 102.9 | 0.9 |
| පිගන් මැටි නිෂ්පාදිත | 31.3 | 0.3 | 30.1 | 0.3 |

| | | | | |
|---|---|---|---|---|
| අනෙකුත් කාර්මික අපනයන | 937.1 | 7.9 | 962.8 | 8.1 |
| **ඛනිජ අපනයන** | **34.4** | **0.3** | **33.9** | **0.3** |
| **වර්ග නොකළ අපනයන** | **17.8** | **0.1** | **17.9** | **0.2** |
| **මුළු අපනයන** | **11,889.60** | **100** | **11,940.00** | **100** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය** | 162.54 | | 178.78 | |

**ප්‍රධාන භාණ්ඩ අනුව ආනයන සංයුතියේ උපනතිය.**

| | **1977** | **2019** |
|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | 42% | 20.6% |
| **අන්තර් භාණ්ඩ** | 45% | 78.9% |
| **ආයෝජන භාණ්ඩ** | 12% | 0.3% |

## ❖ ශ්‍රී ලංකාවේ  අපනයන සංයුතිය

ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ ව්‍යුහය ප්‍රධාන කොටස් හතරකි.

- කෘෂිකාර්මික අපනයන
- කාර්මික අපනයන
- ඛනිජ අපනයන
- වර්ග නොකළ අපනයන

ප්‍රධාන කාණ්ඩ අනුව අපනයන සංයුතියේ උපනතිය

| | 1977 | 2019 |
|---|---|---|
| කෘෂිකාර්මික අපනයන | 79% | 20.6% |
| කාර්මික අපනයන | 14% | 78.9% |
| ඛනිජමය අපනයන | 5% | 0.3% |
| වර්ග නොකළ අපනයන | 2% | 0.2% |